දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2012 පෙබරවාරි
# First Examination in Arts (External) – February 2012

සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය
## SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**
**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.**

---

(01) "පෙර'පර වණන් ගළපනු සඳ නම්" මේ සිදත් සඟරා උධෘතයද සැලකිල්ලට ගනිමින්
(i) සන්ධි යනු කවරේ දැ යි හඳුන්වන්න.
(ii) වර්තමාන සිංහල ව්‍යවහාරයේ එන සන්ධි ප්‍රභේද විචාරයට ලක් කරන්න.

(02) (i) ප්‍රත්‍යයාර්ථ ශබ්ද හඳුන්වන්න.
(ii) තද්ධිත පද සාධනය හා එහි විවිධාර්ථ නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(03) (i) සර්වනාම හා එහි ප්‍රභේද හඳුන්වන්න.
(ii) භාෂා ව්‍යවහාරයේ දී සර්වනාම භාවිතයේ වැදගත්කම සනිදර්ශන ව දක්වන්න.

(04) "පියෙවි දෙ වැදෑරුම් දා පියෙවි සඳ පියෙවි වී" මේ සිදත් සඟරා උධෘතය ඇසුරින් සිංහලයේ ප්‍රකෘති භාවිතය පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් සපයන්න.

(05) "පියෙවි නිසා හොත නො නිසා හොත කෙළේ නිපා නම්" මේ සිදත් සඟරා උධෘත පාඨය ඇසුරින් සිංහල භාෂා ව්‍යවහාරයෙහි එන නිපාත අර්ථ යෝගය පැහැදිලි කරන්න.

(06) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් <u>හතරකට</u> ලුහුඬු විවරණ සපයන්න.
(i) ඝෝෂ, අඝෝෂ ශබ්ද
(ii) පිළි පෙරළි හා වණ පෙරළි
(iii) ආදේශ සන්ධි
(iv) විධි ක්‍රියා
(v) ගෞරවාර්ථ බහුවචන ප්‍රත්‍ය
(vi) දකාරාර්ථ සමාසය
(vii) අර්ථ ක්‍රියා

(07) පහත දැක්වෙන ගද්‍ය පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සියලු ලොවැ ඇති තාක් වස්තූන් ගෙ නො එක් පැ තාක් එක් කොටැ හනා අලළාපුවාක් වැනි වූ පබසර රස් කඳ තල් කඳ පමණ වැ, කූටාගාර ප්‍රමාණ වැ, හුණු කුළලින් පිඹැ නඟාපු සහපුකැටි සෙ සියලු නුවර වසමින් පැතිරෙන්නට වනැ.

මෙ සේ පැතිරී සවනක් ඝන බුදු රසින් මුළු ලොවැ සදමින් වඩුත් වඩුත්, නුවර රසින් සැදෙත්, සැදෙත් පිල් සත් විදහා ගෙයි ගෙයි මොනරුන් නටත් නටත්, මැදිරියෙහි හුන් ගිරා-සැළලිහිණි ආදි පක්ෂීන් පියා පැහැර හඬත් හඬත්, වීණා වේණු මිහිඟු බෙර ආදි ගැසුවන් නැති වැ තම තමා මැ හඬත් හඬත්, හන් පළන් ආභරණ තම තමා මැ කිඞ්කිණික ජාල සෙ මධුරනාද පවත්වත් පවත්වත්, මෙ සලකුණින් 'වැඩි ද වනැ'යි දික් කළ ඇසට, යුගාන්තවාතයෙන් ඉපිලැ ආකාශයට පැනැ නැඟි සත් රුවන් මෙර සෙ ස්වාමිදරුවාණෝ එක විටැ මැ පැනී ගියා හ. ඇස් දල්වී ගියෙ, කට දල්වී ගියෙ, අක්පයින් සිටිනට වන් හ. 'සාධු සාධු' යි කියන්නට වන් හ, සතුටු කඳුළු පරහන්නට වන්හ. හිසැ සිටැ සර්වාඞ්ගයෙහි රෝම තාක් හැප්සෙන්නට වන. සන්ධ්‍යා වලා සෙ රත් වූ පලසින් වසා දිව්‍ය වීථියට යතාලු ඓරාවන නම් මතැත්හු සෙ වඩනට වන් හ. හෙන මහ තරුවක් පස්සෙහි අනු වැ තුඹු රස්කඳක් සෙ එ මහණ පිරිස මුළු ලො ඇස් හයන්නට වන් හ. අග සිටැ මූලට දෙව්දුනු හා විදුලියෙන් හා වෙළීගිය, මුඳුන් හි සිටැගත් හිරු මඬලෙන් හා සඳ මඬලෙන් හා හොබනා, සුවාසූ දහසක් යොදුන් උස ඇති යුගන්ධර පර්වතය සෙ අවුත් වීථී කෙළවරට වැදැ ගිය හ. එබු එබු පයට පිපි පියුමෙන් සියලු වීථිය රත් පියුම් පිපී වැනී ගිය ආකාශ ගඞ්ගාව සෙ අතුරු සිදුරු නැති වන්නට වන. දෙවි බඹහු උඩ අහසැ අපොළන්නට වන් හ. මෙ සෙ සියලු ලොව විස්මය වෙග වසඟ කෙරෙමින්, ඇසක් ඈතින් ඈතට නො යවා, කරක් ඈතින් ඈතට නො නම්වා නීරාජනා මඞ්ගලයට සාදා ගෙනැ යන ගන්ධ හස්තියක්හු සෙ ගෙපිළිවෙළින් වඩනට වන් හ.

(i) මේ පාඨය ලිහිල් බසින් ලියන්න.
(ii) මෙහි දක්නට ඇති විශේෂ භාෂා ලක්‍ෂණ කවරේ දැ යි පහදන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි)